පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

# දෙවන වාර පරීක්ෂණය - 2025

## සිංහල සාහිත්‍යය රසාස්වාදය - පිළිතුරු පත්‍රය

විෂයය :- ......................................................................

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය :

I පත්‍රය

**01 ප්‍රශ්නය**

(I) (අ) ඔක්කාක රජ මාළිගාව ඉදිරිපිට රැස්වූවන්

(ආ) මහලු බමුණු වෙසක් මවා ගත් ශක්‍රයාට / මහල්ලාට (ලකුණු (04)

(II) (අ) කබාය ලොගෙන අශ්වයා සිටින ඉස්තාලයට යාම

(ආ) වැලපීම (ලකුණු 04)

(III) (අ) කප්පට වෙළෙන්දා

(ආ) දඹදෙණි යුගය (ලකුණු 04)

(IV) (අ) නුහුසුවන්ගේ - ගෝනුස්සන්ගේ

සියලු'ගෙහිම - සියලු ශරීරයේම

(ආ) කුරිරු වූ සෝර සර්පයන්ගේ දළ කෙළවර විෂ ඇත. මැසි මදුරු සමූහයාගේ තුඩ කෙළවර විෂ ඇත. රෞද්‍ර වූ ගෝනුස්සන්ගේ වලිගය අග විෂ ඇත. නපුරු දුර්ජනයන්ගේ ශරීරය පුරාම විෂ ඇත. (ලකුණු 04)

(v) (අ) ඇස්. මහින්ද හිමි

(ආ) යුතුකම (ලකුණු 04)

**02 ප්‍රශ්නය - ඡේදය**

(I) කුස කුමාරයා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍ය අප්සරාවක් විය හැකි යැයි සිතා ඇල්ලීමට අපොහොසත් වීම නිසා (ලකුණු 04)

(II) එකල්හි මහා බෝධි සත්වයෝ ඒ රත්රුව කොමු නූලෙන් වියන ලද රත් පැහැති වස්ත්‍රයක් අන්දවා නිදන කාමරයෙහි සිටවූහ. (ලකුණු 04)

(III) තමන් කළ රන් රුව ආභරණ ආදියෙන් සරසා රථයක තබා මෙබඳු රූපයක් ඇති කෙනෙකු ලැබුණ හොත් විවාහ කර ගනිමි" කියා රතු රුව මැණියන්ට යැවීම. (ලකුණු (06)

(IV) විවාහයට තමා අකමැති බව සිය දෙමාපියන්ට තුන් වාරයක් කියූ බෝධිසත්වයෝ සතර වන වාරයේ දෙමාපියන්ට අකීකරු වීම නුසුදුසු නිසා එයට උපක්‍රමයක් වශයෙනි. මෙසේ රන් රුවන් තනා එවැනි රුවක් ඇති කෙනෙකු ලැබුණහොත් විවාහ වන බව කීය. (ලකුණු 06)

නැතහොත්

පද්‍ය පන්තිය

(I) චීචර් චරි, චිච්චරි චරි
වහින වැහි, වහින වැහි (ලකුණු 04)

(II) "ගොහොරු මඩ ඇඟිලිකරු අතර චිරි චිරි ගාන" මඩෙහි එරෙමින් යාමට සිදුවීම
"කාර් රෝදෙන් චිරිස් ඇඟ පුරා මඩ ඉහෙන" මහ මග යන වාහන වලින් විසි වන ජලය තම ඇඟට වැදීම ආදී අපහසුතා (ලකුණු 04)

(III) නිවසට ගොස් තෙමී ගිය රෙදි ඉවත්කොට හිස, ඇඟ පත පිස දමා අලුත් සරමක් ඇඳ උණු තේ කෝප්පයක් පානය කිරීමට
(අවසන් කවිය උපුටා දක්වා විස්තර කිරීම) (ලකුණු 04)

(IV) **ව්‍යවහාර බස**
"පොද නොකැඩි තෙතබරිච්ච හිරිකිතෙන් කිළි පොළන"
"ගොහොරු මඩ ඇඟිලිකරු අතර චිරි චිරි ගාන"

**අනුප්‍රාසාත්මක බස**
"චිචිරි චිරි චිච්චරි වජ"
"වහින වැහි වහින වැහි"

**ගැමි වහර**
හබුරු කොළ මලිපිට්ද, වස්කලන් ඇළි හැදුණු ආදී විස්තර කිරීම් සලකන්න. (ලකුණු (06)

## II පත්‍රය

ප්‍රමාණාත්මක බව, ගුණාත්මක බව, නිවැරදි බව සලකා රසාස්වාදයට හා විචාර ප්‍රශ්න වලට ලකුණු පිරිනමන්න.